වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

# 2022 වර්ෂය වෙනුවෙන් දේපළ බදු දීම සඳහා ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීමයි.(දෙවනවර)

මෙහි පහත උප ලේඛනයේ සඳහන් වෙළෙඳ අයිතීන් **2022.01.01** දින සිට **2022.12.31** දින දක්වා කාලයට බදු දීම සඳහා, ටෙන්ඩර් මවිසින් භාර ගනු ලැබේ.

**02.** ටෙන්ඩර් පත් නිකුත් කිරීම - **2021.11.24** දින සිට **2021.12.03** දින දක්වා ( පෙ.ව. **8.30** සිට ප.ව. **3.30** දක්වා)
ටෙන්ඩර් පත් භාර ගැනීම - **2021.12.06** දින ( පෙ.ව.**8.30** සිට පෙ.ව. **9.45** දක්වා )
ටෙන්ඩර් විවෘත කිරීම - **2021.12.06** දින ( පෙ.ව **10.15** ට )

**03.** පහත උප ලේඛනයේ සඳහන් පරිදි ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තුව සහ ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල් මෙම කාර්යාලයට ගෙවීමෙන් අයදුම්පත් ලබා ගත හැක.

**04.** උප ලේඛනයේ සඳහන් අවම ගාස්තුවට අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් සභාව සතු කරනු ලැබේ.

**05.** බදුකරුවන් ඉල්ලුම්කරනු ලබන මුදලට **1 %** මුද්දර බද්ද ගෙවිය යුතු වේ. ලංසු මුදල තීරණය කර ඇත්තේ ඉහත බදු මුදල් රහිතවය.

**06.** ටෙන්ඩර් අයදුම්පත් ලබා ගැනීමේදී ඉල්ලුම්කරුවන් විසින් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර තම අනන්‍යතාවය තහවුරු කළ යුතු අතර, කලින් වර්ෂ වලදී බදු ගෙවීම පැහැර හැර ඇති කිසිම අයකුට ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

**07.** මෙම කාර්යාලයෙන් ලබා ගත් ටෙන්ඩර් අයදුම්පත් වෙන වෙනම සම්පූර්ණ කිරීමෙන් පසු "මුල් පිටපත" සහ "අනු පිටපත" වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවරවල පිටත "මුල් පිටපත" සහ "අනු පිටපත"යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එකම කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ අදාල ටෙන්ඩරයේ (බදුකරයේ) නම සඳහන් කොට **2021.12.06** දින පෙ.ව.**9.45** ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

**08.** **2021.12.06** දින පෙ.ව.**10.15** ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, එකී වේලාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට ඊට සහභාගි විය හැකිය.

**09.** ටෙන්ඩර් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ටෙන්ඩර් කමිටුවේ තීරණය වන අතර, සභාවේ තීරණය අවසාන තීරණය වේ.

**10.** තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ඒ බව දැනුම් දී දින හතක් ඇතුළත ඇප මුදල් තැන්පත් කිරීම හා ගිවිසුම් අත්සන් කිරීම කළයුතුය. එසේ නොකරන ටෙන්ඩර් කරුවන්ගේ ටෙන්ඩර් ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

**11.** සතිපොළ ටෙන්ඩර් ගනු ලබන අය විසින් බදු අය කිරීම සඳහා මෙම සභාව මගින් නිකුත් කරනු ලබන කුවිතාන්සි පොත් භාවිතා කළ යුතුය. එක් පොතක මිල රු.**200.00** කි.

| | දේපල විස්තර | පවත්වන දින | අවම මාසික බදු මුදල | ටෙන්ඩර් ඇප | ටෙන්ඩර් පෝරම ගාස්තු |
|---|---|---|---|---|---|
| 01 | වැලිගෙපොළ සතිපොළ | සෙනසුරාදා | 13180.00 | 1000.00 | 500.00 |
| 02 | ඕපනායක සති පොළ | සෙනසුරාදා | 7230.00 | 1000.00 | 500.00 |
| 03 | ඕපනායක මාළු ලැල්ල | සෙනසුරාදා | 5600.00 | 1000.00 | 500.00 |

**2021.11.22** දින,
හුණුවල, ඕපනායක,
වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

කේ.ඕ. කැළුම් ප්‍රියංකර ජයසිංහ
සභාපති
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව